# එක්දින වැඩමුළුවේ විවිධ අවස්ථාවන්



වැඩමුළුව ආරම්භ කරමින් .......



මොළය හා ස්නායු පද්ධතිය පිළිබඳ හදාරමින් .....



ගුරු භවතුන්ටද අධ්‍යනයට අවස්ථාවක් .......



සිසු දරු දැරියන් කණ්ඩායම් අධ්‍යයනයක



උපදේශකයෙකු සමඟ අධ්‍යයනයක යෙදෙමින් .....

සැකසුම
එස් ආර් මාසකෝරාළ
ගාමිණී විජේරත්න
කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව

# අසිරිමත් සිරුර

## එක් දින වැඩමුළුව



කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව
වෛද්‍ය පීඨය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව
වෛද්‍ය පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය

මහත්මයාණෙනි/මහත්මියනි

## "අසිරිමත් සිරුර" එක්දින වැඩමුළුව

අධ්‍යයන පොදුසහතික පත්‍ර උසස්පෙළ ජීව විද්‍යා ගුරු භවතුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ විශ්ව විද්‍යාල විද්‍යාවේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පවත්වන එක්දින වැඩමුළුවක් ලෙස මෙම "අසිරිමත් සිරුර" වැඩමුළුව හඳුන්වා දිය හැක.

මෙය ශිෂ්‍ය ශිෂ්‍යාවන් පොත පතේ ද්විමාන රූප සටහන් අධ්‍යයනයෙන් ලබාගත් න්‍යායික දැනුම සත්‍ය නිදර්ශක මගින් ත්‍රිමානව හා ප්‍රායෝගිකව ප්‍රගුණ කර ගත හැකි වටිනා අවස්ථාවකි.

### කවුරුන් සඳහාද ?

- අධ්‍යයන පොදුසහතික පත්‍ර උසස්පෙළ ජීව විද්‍යා ගුරු භවතුන්
- අධ්‍යයන පොදුසහතික පත්‍ර උසස්පෙළ ජීව විද්‍යා සිසු දරු දැරියන්
- විශ්ව විද්‍යාල විද්‍යාවේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන්

### අරමුණ ඃ

අධ්‍යයන පොදුසහතික පත්‍ර උසස්පෙළ ජීව විද්‍යා විෂය නිර්දේශයට අයත් "ක්‍රියාකාරී සත්වයා" යන මාතෘකාවට අදාල ව මිනිස් සිරුරේ ව්‍යුහය හා කෘත්‍යය පිළිබඳව නිදර්ශක ආශ්‍රයෙන් අධ්‍යයනය කිරීමේ අවස්ථාව ඔබට ලබාදී ඇත.
මෙය හුදෙක් අධ්‍යයන පොදුසහතික පත්‍ර උසස්පෙළ විභාගය පමණක් අරමුණු කරගත් වැඩමුළුවක් නොවන අතර එය මිනිස් සිරුරේ අසිරිය දෙනෙතින් දැකිය හැකි හා අවබෝධය ලබාගතහැකි මහඟු අවස්ථාවක් වනු ඇත. එමගින් ඔබ එදිනෙදා අත්දකින සෞඛ්‍ය ගැටළු පිළිබඳ දැනුමක් ඔබට ලබාගත හැකිය.

### වැඩමුළුවේ ස්වභාවය ඃ

මෙම වැඩමුළුව පෙරවරු 8.30 සිට පස්වරු 4.00 දක්වා පැවැත්වේ. එක් වැඩමුළුවක් සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් 40-65 අතර ප්‍රමාණයක් හා ගුරු භවතුන් 3-5 අතර ප්‍රමාණයකට සහභාගි විය හැක. සිසුන් කණ්ඩායම් පහකට බෙදා එක් කණ්ඩායමකට උපදේශකයකු බැගින් යොදවන අතර ඔවුන්ට ලබාදෙන අත් පොතක් ඇසුරෙන් අධ්‍යයනය සිදුකරයි. අවශ්‍ය විටදී නිදර්ශක අතට ගෙන බැලීමට ඉඩදෙන අතර විච්ඡේදනය කරණ ලද මෘත දේහද අධ්‍යයනයට භාවිතා කෙරේ.

මෙම වැඩමුළුවේදී මිනිස් සිරුරේ පහත සඳහන් ප්‍රදේශවල අන්තර්ගත ඉන්ද්‍රියන් පිළිබඳව අධ්‍යයනය කෙරේ.

1. උරස් කුහරය
2. උදර කුහරය
3. ශ්‍රෝණි කුහරය
4. ස්නායු පද්ධතිය හා මොළය
5. ගාත්‍රා

### වැඩමුළුව පැවැත්වෙන ස්ථානය ඃ

කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව
වෛද්‍ය පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය.

### භාෂා මාධ්‍යය ඃ

මෙම වැඩමුළුව සිංහල හෝ ඉංග්‍රිසි යන භාෂා මාධ්‍යයන් ගෙන් පැවැත්වේ. එහිදී වෛද්‍ය පීඨයේ පළපුරුදු කථිකාචාර්ය වෛද්‍යවරුන්ගේ මාර්ගෝපදේශකත්වය ලැබේ.

### වැඩමුළුව සංවිධානය කරගැනීම ඃ

එක් ශිෂ්‍යයකු වෙනුවෙන් රුපියල් 400/= ක මුදලක් අයකෙරේ. එක් වැඩමුළුවක් සඳහා අවම වශයෙන් 50 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සහභාගී කරවා ගැනේ.

මේසඳහා වැයවන මුළු මුදල අදාල පාසලේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අරමුදලකින් ලබාගත හැක.

මෙම වැඩමුළුව පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට හෝ දිනයක් වෙන්කර ගැනීම සඳහා පහත සඳහන් ලිපිනයෙන් හෝ දුරකථන අංක වලින් විමසන්න.

වෛද්‍ය සංජය අදිකාරී
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
කායව්‍යවච්ඡේද දෙපාර්තමේන්තුව
වෛද්‍ය පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය.

දුරකථන අංක ඃ 0812396267/0714473890